*සැ. යු.*- 2018.05.04 දින පළ වූ අංක 2,070 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,071 - 2018 මැයි මස 11 වැනි සිකුරාදා - 2018.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 864 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූනි මස 01 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

1.0 බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 පහත අංක 7 යටතේ දක්වා ඇති විභාග පටිපාටිය අනුව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් හෝ බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා පත්කර ගනු ඇත.

3.0 මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 14 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ට බලය ඇත.

4.0 *වැටුප*.- බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3-III, 3-II, 3-I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය, රු. 29,840 - 10x300 - 11x350 - 10-x560 - 10x660 - රු.48,890 (MT 01-2016) වේ.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.)

6.0 *සුදුසුකම්*.- බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

*(ආ)* අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

*(ඇ)* අයදුම්පත් කැඳවන අවසන් දිනට අවම වශයෙන් පූර්වාසන්න වසර තුන (3)ක් බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.

*(ඉ)* සේවයට පත් කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අවශ්‍යවන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

*(ඊ)* (i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නො අඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

(ii) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවයේ නියුතු සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 45ට නොඑළඹ සිටිය යුතු ය.

*(උ)* *අධ්‍යාපන සුදුසුකම්* :

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන (05) ක් සහිතව විෂයයන් හයකින් (06) එක්වර සමත්වීම.

*(ඌ)* *වෘත්තීය සුදුසුකම්*.- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක/තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම.

7.0 *විභාග පරිපාටිය* :-

7.1 විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.2 විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ :-

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය | 100 | පැය 2 |
| (ii) | අභියෝග්‍යතාව | 100 | පැය 1 |
| | මුළු ලකුණු | 200 | |

*තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය :*

විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම, මෙහෙයුම් පද්ධති, මෘදුකාංග(වදන් සැකසුම, පැතුරුම්පත් ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණය ඇතුලුව) දෘඩාංග, අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල ආදී ක්ෂේත්‍රවලින් තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ව්‍යුහගත හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*අභියෝගතාව :*

විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව, තර්කානුකුල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන :*

රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ. මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබාගත යුතු වේ. තරග විභාගය වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙලට වූ කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

7.3 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවක් ඇතුළත්වන සේ විභාගය සමත් අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය පිරිස් හා පුහුණු අංශයේ වෙබ් අඩවියේ (www.mdtu.wpc.gov.lk) පළකරනු ඇත. එයට අමතරව විභාග යට පෙනී සිටි සියලුම අපේක්ෂකයන් වෙත එක් එක් විෂයය සඳහා ලබාගත් ලකුණු හා කුසලතාව ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් ප්‍රධාන ලේකම් විසින් ලබා දෙනු ඇත.

8.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* :- අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව ඕනෑම අවස්තාවක ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන්පහ කිරීමට පිළිවන.

9.0 විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 600.00 කි. මෙම මුදල බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 (විවිධ ආදායම්) ට බැරවන ලෙස බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකි ය. ඒ සඳහා අයදුම්කරුගේ නමින් නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟතබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10.0 *අයදුම්පත්‍ර* :- ඒ-4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

*(අ)* අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

*(ආ)* අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත්වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු ය.

*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද හෝ දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතු ය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

10.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කරනු ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින්ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත්කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනීසිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂාකරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **''බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය''** යන්න ද සඳහන් කරන්න.

10.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස් වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360.00 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධරයෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018 ජුනි 11 වැනි දින හෝ ඊට පෙර හෝ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු),
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.),
"ශ්‍රාවස්ති මන්දිරය", 32,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

11.0 *විභාගයට පෙනී සිටීම*.- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පිරිස් හා පුහුණු අංශයේ වෙබ් අඩවියේ (www.mdtu.wpc.gov.lk) නිවේදනයක් පළකරනු ඇත. එම නිවේදනය පළවී සතියක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයටම ඒ බව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත දන්වා සිටිය යුතු ය.

12.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

13.0 මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටලුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලතල බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතු වේ. එය අවසන් තීරණය වේ.

14.0 මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

2018 අප්‍රේල් මස 23 වැනි දින.

**බස්නාහිර පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

Open Competitive Examination for Recruitment to Class 3 - Grade III of Western Province Information and Communication Technology Service - 2018

(දෙන ලද කොටුව තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

[ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................................................
..............................................................................................
(උදා.: SIRIWARDANA D.S.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..............................................................................................
..............................................................................................

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..............................................................................................
..............................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :- ..............................................................................................
..............................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :- ..............................................................................................
..............................................................................................

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :- වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.3 2018.03.01 වැනි දිනට වයස :- අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.4 දුරකතන අංකය :- | | | | | | | | | | |

4.0 අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය :

4.1.1 අ.පො.ස (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර : (පළමුවර)

i. විභාගයේ වර්ෂය හා මාසය :- ..................................
ii. විභාග අංකය :- ......................................
iii. ප්‍රතිඵල :-

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

4.1.2 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර : (දෙවන වර) :

i. විභාගයේ වර්ෂය හා මාසය :- ..................................
ii. විභාග අංකය :- ......................................
iii. ප්‍රතිඵල :-

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

4.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :-

i. විභාගයේ වර්ෂය හා මාසය :- ..................................
ii. විභාග අංකය :- ......................................
iii. ප්‍රතිඵල :-

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3 පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,

i. විශ්ව විද්‍යාලය :- ..............................................
ii. උපාධිය :- ..............................................
iii. විභාග වර්ෂය :- ..............................................
iv. ප්‍රධාන විෂයයන් :- ..............................................

5.0 වෘත්තීය සුදුසුකම්,

5.1 හදාරා ඇති පරිගණක පාඨමාලාවේ නම :- ..............................................
5.1.1 පාඨමාලාව හදාරා ඇති ආයතනය :- ..............................................
5.1.2 වර්ෂය :- ..............................................
5.1.3 පාඨමාලා කාලය :- ..............................................

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ "✓" ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

..........................................................................................................................................................................
..........................................................................................................................................................................

7.0 *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :- ..............................................
ii. ලදුපත් අංකය හා දිනය :- ..............................................
iii. ගෙවූ මුදල :- ..............................................

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

8.0 *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද විභාග ගාස්තු ගෙවන ලද අංක ............................ හා ............................ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මෙයට අලවා ඇති බවද ප්‍රකාශ කරමි.

*(ආ)* මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකුවන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

*(ඇ)* තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

…………...………… ,
අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………… .

9.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

………………..........………………… ,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :…………………… .

10.0 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය* : (අයදුම් කරන රජයේ නිලධාරීන්ට පමණක් අදාළ වේ.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................. මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් දරන තනතුරක සේවය කරන බව ද, මෙම විභාග නිවේදනය ප්‍රකාරව මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බව ද, එම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද සහතික කරමි.

……………………………………
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :…………………

05-166

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතනවල ඇති කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම**

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතනවල පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු පවතින තනතුරු -

1. රසායනාගාර සහකාර
2. මුරකරු
3. සනීපාරක්ෂක කම්කරු
4. ශිෂ්‍ය නේවාසිකාගාර සහකාර පාලිකා

(i) *සුදුසුකම්.-* එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමට අදාල සුදුසුකම් පහත සඳහන් කර ඇත.

(ii) *පදිංචිය.-* අයදුම්කරුවන්/අයදුම්කාරියන් බස්නාහිර පළාතේ අවම වශයෙන් වසර 3 ක් ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.

(iii) *වයස් සීමාව.-* අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. උපරිම වයස් සීමාව රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් රැකියාවන්හි නියුතුවූවන් කෙරෙහි බලනොපවත්වනු ඇත.

02. *තනතුරු සඳහා ඉල්ලුම් කළයුතු පිළිවෙල.-* මෙම නිවේදනයේ පහත දක්වෙන ආදර්ශ අයදුම්පතට අනුකූලව සකස් කළ අයදුම්පත් සම්පූර්ණ කර 2018.05.31 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, අංක 89, 4 වන මහල, රන්මඟපාය, කඩුවෙල පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතුවූවකු නම් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

03. *තෝරා ගැනීම.-* ඉදිරිපත් කරන ලද අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

04. එක් අයදුම්කරුවෙකුට එක් තනතුරක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එසේම නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියළුම අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

05. බස්නාහිර පළාතේ ඕනෑම පාසලක සේවය කිරීමට එකඟ විය යුතු වේ.

06. මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ. තවද ඒ අනුව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

07. බඳවා ගැනීම පිළිබඳ හෝ බඳවා නොගැනීම පිළිබඳ සියළු තීරණ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතු වේ.

01. **තනතුරු නාමය.- රසායනාගාර සහකාර**

*අධ්‍යාපන සුදුසුකම්.-*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව ඇතුළුව තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) <u>එකවර</u> අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සමත්ව තිබීම.

*සහ*

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

*බඳවා ගැනීමේ ක්‍රමය.-*

පුරප්පාඩු ප්‍රමාණයට වඩා අයදුම්පත්‍ර ලද හොත් බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක් මඟිනි. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව සීමිත බැවින් ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

බස්නාහිර පළාත් රසායානාගාර සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ලිඛිත තරග විභාගය පහත පරිදි වේ.

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

i. විෂයානුබද්ධ දැනුම - කාලය පැය 01 (ලකුණු 100)

ii. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 (ලකණු 100)

ලිඛිත විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබා ගෙන විෂයයන් දෙකම සමත් විය යුතුය.

*විෂය නිර්දේශය :*

විෂයය අංක 01 - විෂයානුබද්ධ දැනුම

තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය විෂයානුබද්ධ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි.

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කරුණු විමසා බැලෙන සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

විභාග ගාස්තුව රු. 400/-කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ අංක 20.03.02.99 ආදායම් ශීර්ෂයට බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

අයදුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනීසිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය.

එසේම එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360/- ක මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ සංස්ථාපිත මණ්ඩලයක ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

*අපේක්ෂකයෙකුගේ අනන්‍යතාවය.-*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

*වැටුප් පරිමාණය* - (මාසික)

MN 1 - 2016 වැටුප රු. 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 - රු. 45, 540/-
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2018.01.01 දිනට ගෙවන වැටුප රු. 21,532/-

රැකියාවේ ස්වභාවය - පළාත් සභා විදුහල්වල විද්‍යාගාර හා රසායනාගාර පිළිබඳ භාරකාරත්වය හා ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම දැරීම හා තම සේවා විෂයය පථයට අදාළ කරුණු පිළිබඳ අධීක්ෂණ නිලධාරීන් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම හා ඔවුන් විසින් පවරන වෙනත් රාජකාරි.

02. **තනතුරු නාමය - මුරකරු**

*අධ්‍යාපන සුදුසුකම්.-*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් හය (06) කට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන (02) ක් සහිතව සමත්ව තිබිය යුතුය.

මුරකරුවන් සඳහා ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැති අවස්ථාවන්හිදී 8 ශ්‍රේණිය/ 9 වසර සමත් අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

*රැකියාවේ ස්වාභාවය -*

පාසල් පරිශ්‍රයේ සියළුම භෞතික සම්පත් හා පාසල් පරිසරයට අයත් දෑ ආරක්ෂා කිරීම පිළිබඳව වගකීම දැරීම

*වැටුප් පරිමාණය - (මාසික)*

PL 1 - 2016 වැටුප රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36, 410/-
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2018.01.01 දිනට ගෙවන වැටුප රු. 19,242/-

03. **තනතුරු නාමය - සනීපාරක්ෂක කම්කරු**

*අධ්‍යාපන සුදුසුකම්.-*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක්වරකදී විෂයයන් හය (06) කට නොඅඩු යටත් පිරිසෙයින් සම්මාන (02) ක් සහිතව සමත්ව තිබිය යුතුය.

සනීපාරක්ෂක කම්කරුවන් සඳහා ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැති අවස්ථාවන්හීදී 8 ශ්‍රේණිය/ 9 වසර සමත් අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

*රැකියාවේ ස්වභාවය.-*

වැසිකිළි, කැසිකිලි දෛනිකව පිරිසිදු කිරීම, කැලි කසල හා සතුන්ගේ අපද්‍රව්‍ය ඉවත් කිරීම, කාණු පද්ධතිය පිරිසිදුව තබා ගැනීම, කසල අපහරණ පද්ධතියේ අවහිරතා ඉවත් කිරීම.

*වැටුප් පරිමාණය - (මාසික)*

PL 1 - 2016 වැටුප රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36, 410/-
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2018.01.01 දිනට ගෙවන වැටුප - රු. 19,242/-

04. **තනතුරු නාමය - ශිෂ්‍ය නේවාසිකාගාර සහකාර පාලිකා**

*අධ්‍යාපන සුදුසුකම්.-*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් ; හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම්.-*

ප්‍රථමාධාර දීම, සාත්තු සේවය සම්බන්ධ රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03 ට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

*පළපුරුද්ද.-*

ප්‍රථමාධාර ලබා දීම හා සාත්තු සේවය සම්බන්ධ සේවාවන් ඉටු කරන රජයේ හෝ පෞද්ගලික ආයතනයක මාස 06 ට වැඩි පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.

*රැකියාවේ ස්වභාවය* - නේවාසිකාගාරවල සිටින සිසුන්ගේ සමස්ථ ක්‍රියාවලිය සම්බන්ධ කටයුතුවලදී ශිෂ්‍ය නේවාසිකාගාර පාලිකාවට සහාය වීම, මුළුතැන්ගෙයට අදාළ සියලුම කටයුතු හා උපකරණ පිළිබඳ සොයා බැලීම හා ආරක්ෂාව, රජය හා සිසුන් සතු දේ ආරක්ෂාවට කටයුතු කිරීම, නේවාසිකාගාරවල ජලය, විදුලිය, පවිත්‍රතා කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම, රෝගී සිසුන් පිළිබඳව සොයා බැලීම හා අවශ්‍ය විට කඩිනමින් ප්‍රථමාධාර ලබා දීම.

*වැටුප් පරිමාණය (මාසික) :*

MN1-2016 වැටුප රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2018.01.01 දිනට ගෙවන වැටුප රු. 21,532

සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

* අධ්‍යාපන සහතික
* උප්පැන්න සහතිකය
* ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය
* වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

එස්. ජී. විජයබන්ධු,
පළාත් අධ්‍යාපන ලේකම්,
බස්නාහිර පළාත.

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතනවල කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුල් අකුරු සමඟ නම :..........................................................................................

(ii) සම්පූර්ණ නම :..........................................................................................

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................

03. ස්ථිර ලිපිනය :..........................................................................................

04. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................

05. විවාහක/අවිවාහක බව :..........................................................................................

06. ඉල්ලුම් කරන තනතුර :..........................................................................................

07. (i) උපන් දිනය :..........................................................................

2018.05.31 දිනට වයස :

අවු :......................... මාස :........................ දින :...........................

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ උපතින් ද ලියාපදිංචියෙන් ද ? ..................................................................

08. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

*(අ)* ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම් :

(ශිෂ්‍ය කාර්ය දර්ශනයේ හා විභාග සහතිකවල සහතික කළ පිටපත් අමුණා ඇත)

*සමත් වර්ෂය හා විභාග අංකය :* ................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| ................................................................. | ..................................... |
| | |

*(ආ)* වෘත්තීය සුදුසුකම් :.........................................................................................................................................

*(ඇ)* සේවා පළපුරුද්ද :.........................................................................................................................................

09. කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියෙන් දඬුවම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :

.......................................................................................................................................

.......................................................................................................................................

10. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදිව බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීම පිළිබඳව වන කොන්දේසි අනුව ම' විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත් හා සම්මුඛ පරීක්ෂණයට පෙර ඒ බව හෙළි වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................................

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන.......................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ............................ වශයෙන් ස්ථිර සේවයේ යෙදෙයි. උක්ත තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවත්/අවසන් නොවූ විනය ක්‍රියාමාර්ග යක් නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

.................................................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලය පවරන ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :...........................................................................................

පදවි නාමය :.............................................................................

දෙපාර්තමේන්තුව/ආයතනය :................................................

දිනය :...........................................................................................

## ආදර්ශ අයදුම් පත්‍රය

| බස්නාහිර පළාත් රාජ්‍ය සේවය | |
|---|---|

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ රසායානාගාර සහකාර පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2017**

Competitive Examination for the Recruitment of Lab Assistant to fill Vacancies under Ministry of Education (Western Province) - 2017

- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය - සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4 ☐

(රාසායනාගාර සහකාර පුරප්පාඩු සඳහා අයදුම් කරන මාධ්‍යය විය යුතුය. අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- විභාගයට පෙනී සිටින නගරය
  කොළඹ - 1
  ගම්පහ - 2 අදාළ නගර අංකය කොටුව තුළ සඳහන් කරන්න. ☐
  කළුතර - 3

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................................
..........................................................................................
(උදා.: GUNAWARDHANA M.G.B.S.K.)

1.2 මුලකුරුවලින් දැක්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................................
..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :-..........................................................................................
..........................................................................................

2.0 2.1 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................................
..........................................................................................
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 වර්තමාන ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :-..........................................................................................
..........................................................................................

2.3 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :-..........................................................................................
..........................................................................................

2.4 දුරකථන අංකය :- රාජකාරි :...................................... පෞද්ගලික :....................................

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐

(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :- වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 2017.05.31 වැනි දිනට වයස :- අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4.0 අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :

4.1 අ.පො.ස. (සා. පෙළ) ප්‍රතිඵල :

පළමුවන වර : වර්ෂය :.................................. විභාග අංකය :......................................

| *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* | *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල :

වර්ෂය :.................................. විභාග අංකය :......................................

| *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 5.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :....................................................................

5.2 කුවිතාන්සියේ අංකය :..........................................................................

5.3 නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.......................................................................

5.4 දිනය :................................................

*මුදල් ගෙවූ ලදුපත මෙහි නොගැලවෙන සේ අලවන්න.*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරා ගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ (බ.ප.) විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....................................................................
අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන.

දිනය :...........................................

06. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවද ඔහු/ඇය .................................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

.........................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
(නිල මුද්‍රාව).

දිනය ඃ................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ................................................
අත්සන ඃ................................................
තනතුර ඃ................................................
ලිපිනය ඃ................................................

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතු ය.)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** (අනවශ්‍ය වචන කපා හරින්න.)

............................................................................................ මයා/මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

....................................................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ
නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය ඃ................................................
තනතුර ඃ................................................
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ඃ................................................

05-281

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.